සිනුවර හසුන

සිඩ්නි සිට ලියමි

තමන් ආදරය කළ තම නිජබිම හැර දමා විවිධ හේතු නිසාවෙන් මෙරටට පැමිණ වෙසෙන මා වැනි දෙමව්පියන් බොහෝ දෙනෙකුන් හට පොදු වූ එක්තරා බලාපොරොත්තු පොදියක් ඇත. මෙහි මුල් තැන ගන්නේ එද ලංකාවේ දී අපට මුහුණ දෙන්නට සිදුවූ මහා තරගයට යට නොවී වඩා පහසුවෙන් හොඳ අධ්‍යාපනයක් ලබා ගෙන හොඳ අනාගතයකට අත්තිවාරම ඒ මගින් ලබා ගැනීමට හැකි වේවා යන්නයි.

එසේම, තම දරුවන් කොයි ආකාරකින් හෝ තම සිංහල භාෂාව, සංස්කෘතිය හා චාරිත්‍ර වාරිත්‍ර ඉදිරියට පවත්වාගෙන යනු ඇතැයි පැතීම ද අප බොහෝ දෙනෙක් උවු සිතින් මෙන්ම යටි සිතින් ද කරන්නකි.

දෙමව්පියන් ගේ මේ දෙවෙනි පැතුම ඉටු කිරීම නම් අපේ දරුවන් බොහෝ දෙනෙකුට සැහෙන්න අසීරු කටයුත්තක් බව නොරහසකි.

සිංහල දෙමව්පියන් ට දව මේ රටේ දී උපදින දරුවන්ට සිංහල භාෂාව පුරුදු පුහුණු වීමට අසීරු වන්නේ ඇයි යනුවෙන් මගේ මිතුරෙක් නැගූ පැණයට පිලිතුර ලෙස මගේ සිතට නැගුණේ එයට හේතුව නම් ලංකාවේ උපදින දරුවන් මෙන් නොව මේ දරුවන් පෙර ආත්මයේ ඉංගිරිසිය කතා කළ ඕස්ට්‍රේලියානුවන් නිසා ඔවුන් ට ඒ පෙර පුරුද්ද අනුව ඉංගිරිසිය වඩා කටට හුරු බවයි.

ඒ විහිළු කෙසේ වෙතත්, වයස අවුරුදු දෙකක්වත් නොවී යන්තම් බහ තෝරන වියේ සිටියදී මෙරටට ගොඩ බට මගේ දියණියට සිංහල පුරුදු කරන්නට අප කළ වෑයම කෙතරම් ද කිව නොහැක. කතාවට අමතරව සාක්‍ෂරතාවයක් ලබා දීම නම් සිහිනයක් පමණකි.

මේ අවශ්‍යතාවය ඇති දෙමව්පියන් ගේ එකමුතුවීමෙන් මෙල්බර්න් මෙන්ම සිනුවර ද සිංහල භාෂා පන්ති ද, සිංහල නැටුම් පන්ති ද සතිපතා පැවැත්වේ. ඒ ආශ්‍රිතව විවිධාකාරයේ ප්‍රසංගයන් ද සංවිධානය වෙයි. නමුත් එද අප ලංකාවේ දී දෙවන භාෂාවක් ලෙස ඉංගිරිසිය උගත් තරමට වත් සිංහල ඉගෙන ගන්නට පොදුවේ අපේ දරුවන් ට හැකි වේදැයි සැක සහිතය.

කරුණු මේ හැටි වුනත්, විටින් විට මේ සම්බන්ධයෙන් අපේ සිත් සතන් පහන් වෙන ආකාරයේ ආරංචි ද අහන්නට ලැබේ. පසුගිය දිනක පැවැත්වුණු නිව් සවුත් වේල්සයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රජා භාෂා අංශයට අනුබද්ධ පවත්වාගෙන යන උතුරු පැරමටා සිංහල පාසලේ බුවනෙක ආරච්චි සිසුවා, සිංහල භාෂාව වෙනුවෙන් ප්‍රාන්ත අධ්‍යාපන ඇමති සම්මානයක් දිනා ගැනීම මෙහිදී සිහියට නැගේ.

සිනුවර හසුන පාඨකයින් හා බෙද හද ගැනුමට, මේ ආකාරයේ ම තවත් අතිශය ප්‍රීති ජනක ආරංචියක් ඇත. එනම්, සිනුවර ඉපිද මෙහිම හැදෙන වැඩෙන සිංහල දරුවෙකු තමන් ගේ ම ගීත ඇතුලත් සංයුක්ත තැටියක් එළි දක්වන්නට නියමිතව ඇත යන්නයි.

මේ ළමා ගායකයා තිසල් වංසජ පාදුක්ක විදන වේ. ඔහුගේ හඬින් ගැයෙන ගීත සොලොසක් ඇතුලත් "මගේ උරුමය" සංයුක්ත තැටිය ඔක්තෝම්බර් තුන් වෙනිදු දෙරට වඩන්නට කටයුතු සියල්ල මේ ලිපිය ලියන මොහොත වන විට සූදනම් වෙමින් පවතී. තිසල් පාදුක්ක විදන සිනුවර තදසන්නයේ පවත්වාගෙන යන බලැක්ටවුන් සිංහල පාසලේ ශිෂ්‍යයෙකි.

මෙය පොදුවේ ඔස්ට්‍රේලියාව තුලත්, සිනුවර තුලත් සිංහල භාෂාවේ ඉදිරි පැවැත්ම පිළිබඳ සුභ ආරංචියක් යයි මම සිතමි.

සිංහල පාසල් පිළිබඳව තිසල් ගයන, සංගීත් වික්‍රමසිංහ ගේ සංගීතයෙන් ඔප් නැංවුනු රසික සූරියසාරච්චි ගේ පද රචනය උපුටා දක්වමින් අද සිනුවර හසුන මෙසේ අවසන් කරමි.

සුන්දර රිවි දිනයේ
පින්බර හිමිදිරියේ
සිංහල උගනට පාසල් වෙත යමු
පෙම්බර නැගණියනේ
පෙම්බර මළණුවනේ

මා පිය සිත සනසා
ගුරු උපදෙස් විලසා
සිංහල උගෙනිමු සිංහල කියවමු
සිංහල බස දෙඩමු
යහ ගුණ දම් රකිමු

පිටු දැක පටු බෙද
පිළිබඳ අවවාද
හුයකට ඇමිණුන මුතු ඇට විලසින
එකමුතු වී ඉඳිමු
යහගුණ දම් රකිමු

ලබන මාසයේ නැවත හමුවෙමු.

සිනුවර ආරච්චිල

<sinuwara.arachchila@gmail.com>

ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා
Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ
DENTIST
Facilities are also available for :
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care
1254 Plenty Road, Bundoora 3083
Tel : 03 9467 7760

MIGRATE TO AUSTRALIA
MULTINATIONAL MIGRATION SERVICES &
AUSTRALIAN MIGRATION SERVICES
The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia
ONSHORE
• Graduate skilled visa
• Student visa renewal
• Change visa subclass
• Family sponsored visa
• Skills assessments
• Change course provider
• Partner visa
• MRT (Review application)
OFFSHORE
• Skilled visa
• Student visa
• Visit visa
• In house IELTS
• Business visa
• Spouse visa
• Parent visa
• Appeals
Special rates & terms available for international students
"EXPERIENCE THE DIFFERENCE"
Affordable fees & easy payment terms
Meet our qualified consultants with years of experience who can deliver the results
Senior Migration Consultants:
Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986
Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.
Consultation by Appointment only
Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.
For More Details or Free Online Assesment Visit Our Website
www.multinational.com.au
E-mail : info@multinational.com.au
MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA
MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696